සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
සමාජ සවිබලගැන්වීම් හා සුබසාධන අමාත්‍යාංශය
சமூக வலுவூட்டல் மற்றும் நலனோம்புகை அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT AND WELFARE

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No DDD/HO/04/LH/Revolving | ඔබේ අංකය<br>உமது இல<br>Your No ........ | දිනය<br>திகதி<br>Date 2017.05.09 |

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
සියළුම දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂවරුන්.

**<u>ජීවනෝපාය චක්‍රීය අරමුදලින් ව්‍යාපෘති සඳහා ණය ලබාදීමේ වැඩසටහන සඳහා</u>**
**<u>නව සංශෝධනයන් ක්‍රියාත්මක කිරීම</u>**

උක්ත මැයෙන් ඔබ අමතන ලද මගේ සමාංක හා 2017.02.20 දිනැති ලිපියට අමතර වශයෙනි.

02.ඒ අනුව ජීවනෝපාය චක්‍රීය අරමුදලින් දැනට ක්‍රියාත්මක වඩාත් ඵලදායී ව්‍යාපෘති සඳහා මූල්‍ය පහසුකම් ලබා කර දීම සඳහාත් , සමෘද්ධි නොවන ප්‍රජාව සමෘද්ධි ප්‍රජාමූල බැංකු කරා ආකර්ශනය කර ගැනීම සඳහාත් නව සංශෝධනයක් ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබා ගෙන ඇති බව දන්වනු කැමැත්තෙමි.

02. මෙම නව සංශෝධනය ක්‍රියාත්මක කිරීමේදී ඔබ ඇමතූ 2017.02.20 දිනැති ලිපියේ සඳහන් කරුණුවලට අමතරව පහත නිර්නායකද අවධානයට ගැනීම අවශ්‍ය වනු ඇත.

**නව සංශෝධනය -**

ජීවනෝපාය චක්‍රීය අරමුදලින් මෙතෙක් ලබාදුන් රු.500,000.00 (රු. ලක්ෂ 5) ක් වන ණය සීමාව රු. 1,000,000.00 (ලක්ෂ 10/මිලියනය) දක්වා වැඩි කිරීම.

**නිර්ණායක -**

1. ඵලදායී ජීවනෝපාය ව්‍යාපෘතියක (කෘෂි,සත්ත්ව පාලන හා ධීවර සුළු පරිමාණ කර්මාන්ත, ව්‍යවසාය සංවර්ධන ව්‍යාපෘති ,අලෙවි හා සේවා ) නිරතව සිටින ණය ඉල්ලුම්කරුවන් සඳහා එම ව්‍යාපෘතියේ අවශ්‍යතාවයන් උදෙසා මෙම ණය සීමාව වැඩි කල හැක.
2. මෙම ණය ඉල්ලුම් කිරීම සඳහා දැනටමත් රු.100,000.00 ණය මුදලක් ලබා ගැනීමට සම්පූර්ණ කර ඇති කොටස් මුදල (10 %) හා සමූහ තැන්පත් මුදල (25%)මෙම ණය මුදල සඳහා සලකා බැලීම.
3. සමෘද්ධි බැංකු ණය වැඩසටහනින් හෝ ජීවනෝපාය චක්‍රීය අරමුදලින් අවම වශයෙන් රු 500,000.00 ක ණය මුදලක් ජීවනෝපාය ව්‍යාපෘතියක් සඳහා ලබාගෙන ගිවිසුම්ගත වූ පරිදි ආපසු ගෙවා තිබීම හෝ රු.200,000.00 ණය මුදල් 02 ක් වරින් වර ලබා ගෙන නිසි පරිදි ගෙවා අවසන් කර තිබීම.

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අධ්‍යක්ෂ (මානව සම්පත්)<br>பணிப்பாளர் (மனிதவளம்)<br>Director (Human Resource) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director ( Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2873802/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 011-2887280 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | Hot Line: 011- 2887722 |
| E-mail- | dg@divineguma.gov.lk | diradmin@divineguma.gov.lk | finance@divineguma.gov.lk | Hot Line:0112-885582 | |
| | | Hot Line :0112-889007 | | | |

4. ඇප සුරකුම් ලෙස දැනට සමෘද්ධි ප්‍රජාමූල බැංකු මඟින් උපරිම රු.500,000.00( ලක්ෂ 5) ණය ලබා දීමේදී සලකා බලන ලද ඇප සුරකුම් ලබා ගැනීම අවශ්‍ය වේ. (කණ්ඩායම් ඇප හා දේපළ ඇප)

5. ණය ඉල්ලුම් කිරීමේදී ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශයෙන් හා දිස්ත්‍රික් ලේකම්ගේ අනුමැතියෙන් යුතු විධිමත් ව්‍යාපෘති වාර්තාවක් ඉදිරිපත් කළ යුතු අතර ඒ මඟින් ව්‍යාපෘතිය සඳහා ප්‍රතිලාභී දායකත්වය සපයා ගත හැකි බවට තහවුරු කර ගත යුතුවේ. මෙහිදී ණයකරුට ණය වාරික අඛණ්ඩව ගෙවීමට ඇති හැකියාව පිළිබඳවත් බැංකු කළමණාකරු හා අදාළ පාර්ශවයන් සෑහීමකට පත්විය යුතුය.

6. ණය ඉල්ලුම්කරු සමෘද්ධි ප්‍රජාමූල බැංකුව හෝ ප්‍රජා මූල බැංකු සමිතියකින් ලබා ගත් ණය මුදලක් පැහැර හැර නොතිබීම හා වෙනත් බැංකු හෝ මුල්‍ය ආයතනවලින් ලබා ගත් ණය මුදලක් පැහැර හැර නොතිබිය යුතුයි.

7. මුළු ණය මුදලම 12 % ක වාර්ෂික පොලි ප්‍රතිශතයක් යටතේ (හීනවන ශේෂ ක්‍රමයට) උපරිම වසර 6 ක් තුළ වාරික 72 කින් නැවත අය කර ගත යුතු අතර ව්‍යාපෘතියේ ස්වභාවය මත පොලියද සමඟ ණය ගෙවීමේ සහන කාලයක් ලෙස උපරිම මාස 04 ක් ලබා දීම සම්බන්ධයෙන් සලකා බැලිය හැක.

8. ණය මුදල කාරක ප්‍රාග්ධනය සඳහා යෙදවීමේදී එය නිෂ්පාදන ධාරිතාවය සමඟ ගැලපේදැයි පරීක්ෂා කිරීම (කාරක ප්‍රාග්ධනය සඳහා ණය ලබා දීමේදී මුළු ණය අවශ්‍යතාවයෙන් 50% ක් පමණක් ණය ලෙස ලබා දීම).

9. ණය මුදල අවශ්‍යතාවය අනුව කොටස් වශයෙන් ලබා දීම සහ අදාළ කොටස් නිකුත් කිරීමේදී කලින් නිකුත් කල කොටසින් යෝජිත වැඩ කොටස අවසන් කර ඇත්දැයි සෑහීමකට පත්වීම.

10. කෘෂි ව්‍යාපෘති සඳහා ණය ලබාදීමේදී දිගුකාලීන කෘෂි කාර්මික බෝග හා කෘෂිකාර්මික ආංශික කර්මාන්ත සඳහා ණය ලබා දීම සිදුකරනු ලබයි.

මෙම වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා ඔබ දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.

නීල් බණ්ඩාර හපුහින්න
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්: -1.සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් - කා.දැ.ගැ.ස. හා අ.ක.ස

2.ප්‍රධාන ගණකාධිකාරී,දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව -කා.දැ.ගැ.ස.

3.ප්‍රධාන අභ්‍යන්තර විගණක ,දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව-කා.දැ.ගැ.ස

4.සියළුම අංශ ප්‍රධානීන් , දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව -කා.දැ.ගැ.ස

5.සියළුම මූලස්ථාන කළමණාකරුවන් - කා.අ.ක.ස. හා මහ සංගම් කළමණාකාර අධ්‍යක්ෂවරුන් , ව්‍යාපෘති කළමණාකරුවන්,ප්‍රජාමූල බැංකු කළමණාකරුවන් හා දිවිනැගුම සංවර්ධන නිලධාරීන් දැනුවත් කිරීම සඳහා